# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1843/13 - 2013 දෙසැම්බර් මස 31 වැනි අඟහරුවාදා - 2013.12.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රාලේඛ/ඉ/1/2/125* .
*ඉඩම් අමාත්‍යාංශයේ ගොනු අංකය* : 4/3/13/2012/ඊ/307.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින්, 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර :*

සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොට්ඨාශ අංක 250 බී දෙහිගස්තලාව ග්‍රාම නිලධාරි වසමේ ගොරොකගහමඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද කැඩැස්තර සිතියම් අංක 620075 කලාප 04න් 03 වැනි කලාපය පත්‍ර අංක 5 පිඹුරෙහි සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0893ක් වූ පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කැබැල්ල:

**උපලේඛනය**

01. **කැබලි අංක 170 - ඉඩමේ නම: දුනුමඩලගහවත්ත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0893; හිමිකම් කියන අය: ඒ. එම්. ඉෂාඩ්, අංක 182/10, ගොරොක්ගහමඩ, බලංගොඩ;**

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම, තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2014 ජනවාරි 29 වැනි දින පෙ. ව. 10.00ට බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2014 ජනවාරි මස 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම්/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරයත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි.

වම්පික නිරෝෂ් ධර්මපාල,
ප්‍රාදේශීය ලේකම්,
බලංගොඩ.

2013 දෙසැම්බර් මස 30 වැනි දින,
බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01 - 419

---

**සංශෝධනයයි**

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : LD/05/2006/VET/489
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය . HIK/DS/LND/04/01/03

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1723/26 දරන 2011 සැප්තැම්බර් මස 15 වැනි බ්‍රහස්පතින්දා දිනැති අතිවිශේෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය) 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීම සම්බන්ධවයි.

එම දැන්වීමෙහි සඳහන් සුනාමි විපතින් අවතැන්වූවන්ට නිවාස ඉදිරිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම ගැන හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින අය මා සම්මුඛ විය යුතු දිනය 2011 ඔක්තෝම්බර් මස 24 දින පෙ.ව. 10.00 වශයෙන් සඳහන් වුව ද එය 2014 මැයි මස 05 දින ප.ව. 1.00 යනුවෙන් සංශෝධනය විය යුතු බවත් එහි 2 වැනි ඡේදයේ සඳහන් තොරතුරු දැනුම් දීමේ දිනය 2014 අප්‍රේල් මස 29 දිනය ලෙසත් සංශෝධනය කරමි.

දමයන්ති පරණගම
ප්‍රාදේශීය ලේකම්
හික්කඩුව

2013 දෙසැම්බර් මස 18 වැනි දින,
හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01-425

1A - G 018787 - 90 - (2013/12)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.